# ③ ව්‍යවසායකත්ව ප්‍රතිලාභ - පිළිතුරු

(1)

| | |
|---|---|
| 1. | ③ |
| 2. | ④ |
| 3. | ③ |
| 4. | ③ |
| 5. | ② |
| 6. | ① |

(2)

1. රටක සංවර්ධනයේ නියමුවන් වන්නේ ව්‍යවසායකයන්ය. භූමිය ශ්‍රමය හා ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක සංයෝග කරමින් මිනිසාට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිපදවීම ඔහුගේ කාර්යයයි. ස්වභාව ධර්මයේ නිමැවුම් හැර මෙලොව ඇති සියලුම නිමැවුම් ව්‍යවසායකයාගේ නිර්මාණ වේ. මේ නිසා රටක ව්‍යවසායකයා යනු සුවිශේෂී පුද්ගලයෙකි.

2.
- ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ
- දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ

3.
- ස්වකීය දෛවය තමා මතම රඳා පැවැතීම
- කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම
- සමාජීය සුභ සාධනය සඳහා දායක විය හැකි වීම
- ප්‍රයෝජනයට නොගත් හැකියා යොදා ගත හැකි වීම
- ආකර්ෂණීය ලාභයක් ඉපැයීම
- වර්ධනය සඳහා පුද්ගලයන්ට ලැබෙන්නා වූ උපරිම අවකාශය
- නිදහස හා ඉහළ තෘප්තියකට පත් වීම

4.
- සමාජයේ ඉහළ පිළිගැනීම.
- සමාජයේ ක්‍රියාකාරීත්වයන්හිදී නායකත්වය හිමි වීම.
- කීර්ති ප්‍රසංශා හිමි වීම.

5.
- රැකියා අහිමි වූවන්ට ආදායම් මාර්ග සලසා දීම
- නිවාස අහිමි වූවන්ට නිවාස සාදා දීම
- පාසල් අධ්‍යාපනයට දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම
- පොදු ගොඩනැගිලි හා උපකරණ ලබා දීම

6.
- අයිතිකරු
- කළමනාකරු
- නායකයා

7. අයිතිකරුගේ භූමිකාව යටතේ

8.

1) ආකර්ශණීය ලාභය

2) ස්වයංපෝෂිත බව
භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ හැකියාව වැඩි වීම

9. මෙහිදී ව්‍යවසායකයෙකු වීමේ ප්‍රතිලාභ හා සේවා නියුක්තිකයෙකු වීමේ ප්‍රතිලාභ සඳහන් කර තිබිය යුතුය.

10. ඒකාකාරී රැකියාවක නිරත වන පුද්ගලයෙකු ගැන සලකා බැලීමේ දී ඔහුට වෙන් වූ යම් විශේෂිත කාර්ය කොටසක් පමණක් ඉටු කිරීමට සිදු වේ. එහෙත් ව්‍යවසායකයෙකුට එසේ වූ නිශ්චිත කාර්යය කොටසක් නැත. ඔහු හැම විටම විවිධ වූ කාර්යයන් තුළ (තම ව්‍යාපාර අවශ්‍යතාව අනුව) යෙදේ. වරෙක නායකයෙකු, සේවකයෙකු, කළමනාකරුවෙකු, උපදේශකයෙකු ආදී ලෙස විවිධ කාර්යයන් කිරීමට ඔහුට අවස්ථාව ලැබීමෙන් තමා තුළ ඇති විවිධ හැකියා ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාව සැලසේ.

11.

- දේශීය සම්පත් උපයෝජනය කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය සිදු කිරීම
- තම භාණ්ඩ හා සේවා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම
- රැකියා අවස්ථා ජනනය කිරීම
- නිමැවුම් අපනයනය කිරීම මඟින් විදේශ විනිමය ඉපැයීමේ හැකියාව
- රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම
- ආදායම් බෙදී යාමේ විෂමතාව අඩු වීම
- ආර්ථික සංවර්ධනයට දායක වීම
- ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා සමාජයක් නිර්මාණය වීම

12.

i. රටක ආදායමේ වැඩි කොටසක් සුළු පිරිසක් අතර බෙදී යාම/ ආදායම ජනගහනය අතර සමානව බෙදී නොයාම

ii. රැකියා අවස්ථා ජනනය කිරීමෙන්
ප්‍රාදේශීය සම්පත් උපයෝජනය කිරීමෙන්
ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීමෙන්

13.

(1) භාණ්ඩ හා සේවා නිපදවීම

(2) සම්පත් භාවිතා කිරීම

14. භාණ්ඩ : ස්මාර්ට් ජංගම දුරකථනය, විද්‍යුත් මෝටර් රථ

සේවා : විද්‍යුත් බැංකුකරණය, නිවසට පැමිණ භාණ්ඩ විකිණීම, විද්‍යුත් මුදල් භාවිතය

15. ව්‍යවසායකයා භාණ්ඩ හා සේවා නිපදවීම බෙදා හැරීම කරන අතර ඔවුන්ගේ වැඩි වීම යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළ යාමයි. මෙය මුළු රට පුරා ඉහළ යාමෙන් රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම සිදු වේ.

16.

1) රටක ජීවත්වන මිනිසුන්ගේ රැකියා අවස්ථා ජනනය වීම ආදායම ඉහළ යාම ජීවන මට්ටම උසස් වීම ආදී සමස්ථ අංශයන්ගේම ඇති වන දියුණුවයි.
2) ඔහු නවෝත්පාදන බිහි කිරීම තුලින් රටේ භාණ්ඩ හා සේවා ප්‍රමාණය ඉහළ යයි. රැකියා සපයන්නෙකු වන ව්‍යවසායකයා නිසා මිනිසුන්ගේ ආදායම ඉහළ යාම මෙන් ම ආදායම් බෙදී යාමේ විෂමතාව ද අවම වේ. මේ අනුව පුද්ගලයාගේ ජීවන මට්ටම ඉහළ යාම සිදු වේ. ඒ මගින් සමස්ත ආර්ථිකයේම වර්ධනයක් සිදුවීමට ව්‍යවසායකයා දායකත්වය සපයන බව කිව හැකිය.

17. විදේශීය රටවල්වල භාණ්ඩ හා සේවා මතම යැපීමට සිදු නොවන ආර්ථිකයකි.

18. රැකියා කළ යුතු වයසේ පසුවන රැකියාවක් කිරීමට කැමති පුද්ගලයන්ට කිසිදු රැකියාවක් ලබා ගැනීමට නොහැකි වීමයි.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව